## දෙවියන් වහන්සේගේ ප්‍රධානත්වය

එක දේවවාදයක් බහුදේවවාදයක් බවට පත්වීමේ අවස්ථා දෙකක් ගැන අපි සඳහන් කෙළෙමු. ඒ භාරතයෙහි හා රෝමයෙහි ය. මේ අවස්ථා දෙකෙහි ම සිද්ධ වූයේ බහුදේවවාදී සංස්කෘතියකට එකදේවවාදය අවභෝෂණය කිරීම ය. එහි දී අප දුටු කරුණක් වූයේ ඒ අවස්ථා දෙකෙහිම ත්‍රිකෝටික න්‍යාය යොදා ගැනීම ය. ඒ එක් අවස්ථාවකින් අනෙක් අවස්ථාව පෝෂණය වූවත් නැතත් ඒ අවශෝෂණ බොහෝ දුරට සමාන මාවත් ගැනීම මගින් කියැවෙන්නේ සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් අවශෝෂණය කිරීමේ දී අනුගමනය කෙරෙන ආකාරය පිළිබඳ ව ද අවශ්‍ය නම් අපට නියම නිර්මාණය කරගැනීමට හැකි බව ද?

එකදේවවාදය දඹදිවට පිවිසීමෙන් පසුව බ්‍රහ්මන් පිළිබඳ ත්‍රිමූර්තිය බිහි වූ අතර රෝමයේ දී ශුද්ධ ත්‍රිත්වය බිහිවිණි. ශුද්ධ ත්‍රිත්වය සංකල්පය බිහිවීම පිළිබඳව අපට දැනට මත තුනක් ඇතිකර ගත හැකි ය. එකක් ක්‍රිස්තුස් වහන්සේ ඒ දිව්‍යානුභාවයෙන් ම ප්‍රකාශ කළ බව ය. දෙවැන්න නම් ක්‍රිස්තුස් වහන්සේට ඒ සංකල්පය සෘජුව ම භාරතයෙන් ලැබුණු බව ය. තුන්වැන්න වනුයේ කතෝලික ආගම හා සම්බන්ධ මේ සංකල්පය රෝමයේ දී ඇති වූ බව ය.

එසේ රෝමයේ දී ඇතිවිණි නම් එය භාරතයේ ආභාසයෙන් නිර්මාණය කළ එකක් ද නැත්නම් රෝමයන් තමන් ම නිර්මාණය කළ එකක් ද යන ප්‍රශ්නය මතුවෙයි. ක්‍රිස්තු භක්තිකයනට හැරෙන්නට අන් අයට මේ සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් දැනට දිය නොහැකි යැයි සිතමි. බොහෝ ක්‍රිස්තු භක්තියනට නම් ඒ ක්‍රිස්තුස් වහන්සේ දේවානුභාවයෙන් ම ප්‍රකාශ කළ එකකි.

මෙහි දී බොහෝ ක්‍රිස්තු භක්තියනට යන යෙදුම පිටුපස ඓතිහාසික කතාවක් වෙයි. ඇතැම් ක්‍රිස්තු භක්තිකයෝ එයට ක්‍රිස්තු වර්ෂයෙන් තුන්වන සියවසේ දි ද විරුද්ධ වී ඇති බවට සාක්ෂි වෙයි. ක්‍රිස්තු වර්ෂ 250 හා 336 අතර කාලයෙහි ජීවත් වූ ඒරියස් (Arius) නම් ක්‍රිස්තියානි පූජකවරයා ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ සංකල්පයට විරුද්ධ විය. ඔහු ඒ සම්බන්ධ කෙතරම් දැඩි මතයක සිටියේ ද කිවහොත් ක්‍රිස්තු වර්ෂ 325 දී පවත්වන ලද කතෝලික සභාවේ පළමු සම්මේලනයේ දී ඔහු විරුද්ධ මතධාරියකු (මිථ්‍යාදෘෂ්ටිකයකු) ලෙස නම්කිරීමට තීරණය විය.

පසුව ක්‍රිස්තු වර්ෂ 335 දී ඔහු නිදහස් කරනු ලැබූ නමුත් ඔහුගේ මරණයෙන් පසු ක්‍රිස්තු වර්ෂ 381 දී කොන්ස්තැන්තිනෝපලයේ පවත්වන ලද පළමු සභාවේ දී නැවතත් මිථ්‍යාදෘෂ්ටිකයකු ලෙස ප්‍රකාශ කෙරිණි. ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ අදහස අද වන විට කතෝලික සභාවේ ද සාමාන්‍යයෙන් ගත්කල කතෝලික නොවන ක්‍රිස්තියානි සභාවල ද පිළිගැනෙයි. එහෙත් අද ද ඇතැම් ක්‍රිස්තියානි සභාවක් ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ අදහස සාමාන්‍ය ක්‍රිස්තියානි සභාවකින් වෙන් වී ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ වෙනත් අදහසක් දරයි.

යෙහෝවාගේ සාක්ෂිකරුවෝ (Yehovah's Witnesses) යනු එවැනි සභාවකි. ඔවුන්ට අනුව ඇත්තේ එක ම දෙවියන් වහන්සේ කෙනෙකි. යෙහෝවා යනු යුදෙව් දෙවියන් වහන්සේ හැඳින්වෙන නාමයයි. ක්‍රිස්තුස් වහන්සේ ද යුදෙව් ජනවර්ගයට අයත් බවත් එහෙත් උන්වහන්සේ යුදෙව්වන්ගේ හා යුදෙව් ආගමේ පූජකවරුන්ගේ ඇතැම් කරුණුවලට හා ක්‍රියාවලට විරුද්ධ වූ බවත් අපි දුටුවෙමු. එහෙත් උන්වහන්සේ ද දෙවියන් වහන්සේ යැයි කීවේ යෙහෝවා දෙවියන් වහන්සේට බව අමතක නොකළ යුතු ය.

එබැවින් ශුද්ධ වූ ත්‍රිත්වයේ සඳහන් දෙවියන් වහන්සේ හා පියා යනු මේ යෙහෝවා දෙවියන් වහන්සේ මිස වෙනත් දෙවි කෙනකු නොවන බව පැහැදිලි ය. ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ සංකල්පයේ දී ප්‍රශ්නය වනුයේ දෙවියන් වහන්සේ හා පියා, දෙවියන් වහන්සේ හා පුතාගෙන් වෙනස් ද නැත් ද යන්න ය. මේ ප්‍රශ්නය අපට වැදගත් වන්නේ දැනුම නිර්මාණය කිරීමේ හා අවශෝෂණය කිරීමේ ප්‍රශ්නය හා සම්බන්ධව ය.

යෙහෝවාගේ සාක්ෂිකරුවන් යන නමින් ම පැහැදිලි වන ආකාරයට ඒ සභාවේ සාමාජිකයෝ යෙහෝවා දෙවියන් වහන්සේ වෙනුවෙන් පෙනී සිටිති. ඔවුහු යෙහෝවා දෙවියන් වහන්සේ එකම දෙවියන් වහන්සේ බවට සාක්ෂි දෙති. එනම් ඔවුන්ට අනුව දෙවියන් වහන්සේ හා පියා දෙවියන් වහන්සේ හා පුතාට වඩා ප්‍රධාන වෙයි. ශුද්ධ වූ ත්‍රිත්වය යනු එකක් ම නොවන බව ප්‍රධාන සංකල්පයක පැවැත්මෙන් පැහැදිලි වෙයි.

© Prof. Nalin De Silva

ඒරියස් නම් ප්‍රජකවරයාට පළමුව මේ ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ විරුද්ධත්වයක් දැක්වූ අය සිටියේ දැයි කීමට නො හැකි ය. කෙසේ වෙතත් මේ සම්බන්ධ අදහසක් ඉදිරිපත් වන්නේ ද ක්‍රිස්තුවර්ෂයෙන් තුන්වැනි සියවසේ බව කතෝලික හා සාමාන්‍ය ක්‍රිස්තියානි සභාවල මතය වෙයි. එපමණක් නොව කතෝලික සභාවේ මතය අනුව ඒරියස් නම් පූජකවරයා සමග එකඟ වී ඇත්තේ  තවත් පූජකවරුන් තුන්දෙනකු පමණ ය. ඔවුහු චෞර පූජකවරු ලෙස හැඳින්වෙති.

තුන්වැනි හා හතරවැනි සියවස් කතෝලික සභාව සම්බන්ධයෙන් ගත්කල වැදගත් කාල පරිච්ඡෙදයක් වෙයි. අපි පසුව මේ පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කරමු. බටහිර විද්‍යාවේ ආරම්භයටත් බටහිර විද්‍යාව මධ්‍යකාලීන යුරෝපයේ ඇති නොවීමටත් මේ සියවස්හි සිදු වූ බලපා ඇති බව පැහැදිලි ය.  කතෝලික සභාව නිල වශයෙන් රෝම අධිරාජයා විසින් පිළිගැණුනේ මේ වකවානුවෙහි දී ය. ඒ කොන්ස්ටන්ටයින් රජු දවස ය. එකල කතෝලික සභාවේ පූජකවරුන් අතර විවිධ මත පැතිරී තිබුණු බව පැහැදිලි ය. මේ මත අතරෙන් නිවැරදි මතය කුමක් දැයි දැනගැනීමට කොන්ස්ටන්ටයින් රජතුමාට අවශ්‍යතාවක් තිබූ බව පැහැදිලි ය. ක්‍රිස්තු වර්ෂ 325 දී කතෝලික සභාවේ පළමු සම්මේලනය කැඳවන ලද්දේ ද එතුමා විසිනි. එතුමා ඒරියස් නම් ප්‍රජකවරයා ඒ සම්මේලනයෙන් පසුව රටින් පිටුවහල් කෙළේ යැයි පැවසෙයි.

ඒ එසේ නමුත් මේ වන විට ඒරියස් පූජකවරයාගේ මත යම් පිරිසක් විසින් පිළිගැනී ඇති බව පැහැදිලි ය. රජතුමාගේ පුතා ද ඒ ප්‍රජකවරයාගේ මතය පිළිගෙන ඇත. පසුව ඒරියස් පූජකවරයා නිදොස් කිරීමත් නැවතත් ඔහු වැරදිකරුවකු කිරීමත් පිළිබඳ කතාවෙන් පැහැදිලි වන්නේ කතෝලික සභාව කුමක් කීවත් ඒ මතවාද අතර තියුණු අරගලයක් ඉහත සඳහන් සියවස්වල පැවති බව ය. පසුව ඒරියස් පූජකවරයාගේ මතය පරාජය කර ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ සංකල්පය ජයග්‍රහණය කරවීමට කතෝලික සභාව සමත් වත ඇත.

දැන් අපි ඒරියස් පූජකවරයා ශුද්ධ වූ ත්‍රිත්වය සම්බන්ධයෙන් කියා ඇති දේ සලකා බලමු. ඒ කරුණු ඒ ආකාරයෙන් ම නොවූව ද ඒකත්වය පිළිබඳ ප්‍රශ්නය භාරතයේත් සංකරාචාර්යතුමාගෙන් පසුව අද්වෛත බ්‍රහ්මන් නම් සංකල්පය නිර්මාණය වීමේ දී සාකච්ඡාවට බඳුන්වන්නට ඇතැයි සිතිය හැකි ය. නාගර්ජුනපාදයන් වහන්සේගේ ශුන්‍යතාව නම් සංකල්පය බිහිවීමේ දී ද ඒකත්වය බලපා ඇත. ඒකත්වය යන්න බෞද්ධ සංකල්පයක් නොවූවත් ඉහළම බෞද්ධ බුද්ධිමතා ලෙස සැලකිය හැකි බෞද්ධ නාගර්ජුනපාදයන් වහන්සේගේ නිර්මාණවලට ද ඒ බලපා තිබීමෙන් පෙන්නුම් කරන්නේ ඒකත්වය ආකර්ෂණීය සංකල්පයක් බනව ය.

ඒරියස් පූජකවරයා කියා සිටියේ ශුද්ධ වූ ත්‍රිත්වයේ අංග තුන එක හා සමාන නොවන බව ය. එතුමාට අනුව දෙවියන් වහන්සේ හා පියා අනෙක් අංග දෙකට වඩා ප්‍රධාන බව ය. එතුමාට අනුව ක්‍රිස්තුස් වහන්සේ හෙවත් දෙවියන් වහන්සේ හා පුතා යන සංකල්පය දෙවියන් වහන්සේ හා පියා යන සංකල්පයට වඩා ද්විතීයික ය. එනම් යුදෙව් දෙවියන් වහන්සේ වූ යෙහෝවා දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහනාසේට වඩා ප්‍රධාන ය.

ඒරියස් පූජකවරයා ඒ මතයට අහේතුක ව පැමිණියා නො වේ. ඔහු ඒ සඳහා ශුද්ධ වූ බයිබලයෙන් කරුණු ඉදිරිපත් කර ඇත. ජෝන් ශාන්තුතුමාගේ සුභාරංචියට අනුව (17: 20-26) ක්‍රිස්තුස් වහන්සේ පවසා ඇත්තේ දෙවියන් වහන්සේ තමන් වහන්සේට වඩා ප්‍රධාන බව ය. එමෙන් ම එතුමා අපොස්තුළුවරුන්ට පවසා ඇත්තේ ඔවුන් ද තමන් වහන්සේ ද දෙවියන් වහන්සේ ද එකම වන බව ය. මෙහි බ්‍රහ්මන් සංකල්පය සමග සමානත්වයක් ඇති බව ද පැහැදිලි ය.

එපමණක් නොව ඒරියස් පූජකතුමාට අනුව ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ සමග සදාකාලික ව වාසය කර නැත. යම්කිසි කාලයක දී දෙවියන් වහන්සේ විසින් ක්‍රිස්තුස් වහන්සේ ද නිර්මාණය කරනු ලැබ ඇත. ඉංගිරිසි ලේඛනවලට අනුව ඒරියස් පූජකවරයා ක්‍රිස්තුස් වහන්සේට නිර්මිත ප්‍රාණියකු (creature) යන වචනය  යොදා ගෙන ඇත. ඉංගිරිසියෙන් ක්‍රීචර යන වචනය ක්‍රියේට් (create) යන වචනයෙන් බිඳෙයි. ක්‍රියේට් යනු නිර්මාණය කිරීම ය. ඉංගිරිසියෙන් ක්‍රීචරස් හෙවත් සත්ත්වයෝ යනු නිර්මාණය කරන ලද ප්‍රාණීහු වෙති. ක්‍රිස්තුස් වහන්සේ ද එලෙස නිර්මාණය කරනු ලැබූවකු ලෙස සැලකෙයි.

© Prof. Nalin De Silva

ඒරියස් පූජකවරයාගේ ඉහත සඳහන් අදහස්වලට අනුව දෙවියන් වහන්සේ පමණක් නිර්මාණය කෙරී නොමැත. එබැවින් ශුද්ධ වූ ත්‍රිත්වයෙහි දෙවියන් වහන්සේ හා පියා හෙවත් යෙහෝවා දෙවියන් වහන්සේට ඇති ප්‍රධානත්වය ක්‍රිස්තුස් වහන්සේට හෝ ශුද්ධාත්මයට හෝ නැත. මේ අදහස් වලින් කියැවෙන්නේ ක්‍රිස්තු වර්ෂයෙන් තුන්වැනි සියවසේ දී ඒකදේවවාදය බහුදේවවාදී රෝම සංස්කෘතියට අවශෝෂණය කිරීමේ දී මතු වී ඇති ගැටලු සමහරකි.

අප කලින් සඳහන් කළ ශුද්ධ වූ ත්‍රිත්වය නිර්මාණය කිරීම පිළිබඳ ව අපට නිගමනයකට පැමිණීමටත් කතෝලික (සමස්තය හෙවත් විශ්වීයත්වය) යන සංකල්පය බිහිවීම පිළිබඳ ව යම් නිගමනවලට පැමිණීමටත් අවශ්‍ය සාධක ඇති බව ය. මේ සියල්ල තුන්වැනි සියවසේ හා හතරවැනි සියවසේ සිදුවීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ  දෙයට අමතර ව තවත් කරුණු ඒ වන විට කතෝලික ආගමට හා සංස්කෘතියට එකතු වී ඇති බව ය. පැරණි රෝමයේ සිදු වූ මේ සිද්ධි ග්‍රීසියේ එයට පෙර සිදු වී ඇති සිද්ධි ද සමග සංසන්දනය කිරීමත් ඇරිස්ටෝටල් න්‍යාය කතෝලික සභාවේ න්‍යාය බවට පත්කිරීමට උත්සාහ ගත් තෝමස් අක්වයිනාස් තුමාගේ ක්‍රියාකලාපය සාකච්ඡා කිරීමත් මගින් පහළොස්වැනි සියවසේ ඉතාලියේ සිදු වූ ඊනියා පුනරුදය  ගැන අපට යම් අවබෝධයක් ලබාගත හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva